**ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන (අයි-මාර්ග) - 2020**

---

ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර අදියර -1 සඳහා 2014 නොවැම්බර් 05 දින එළැඹි අංක 3171 එස්ආර්අයි (එස්එෆ්) ණය ගිවිසුම, අදියර -2 සඳහා 2015 මැයි 28 දින එළඹි අංක 3221 එස්ආර්අයි සහ 3222 එස්ආර්අයි (එස්එෆ්) ණය ගිවිසුම, අදියර -3 සඳහා 2015 දෙසැම්බර් 11 දින එළඹි අංක 3325 එස්ආර්අයි සහ 3326 එස්ආර්අයි (එස්එෆ්) ණය ගිවිසුම, අදියර -4 සඳහා 2017 දෙසැම්බර් 15 දින එළඹි අංක 3610 එස්ආර්අයි (එස්එෆ්) ණය ගිවිසුම යන ණය ගිවිසුම්වල IV ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් සහ වැඩසටහනේ කාලය

වැඩසටහනේ ණය ගිවිසුමට අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය, වර්තමානයේ මහාමාර්ග අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩසටහනේ අරමුණ වන්නේ, ග්‍රාමීය ප්‍රජාව සහ සමාජ ආර්ථික මධ්‍යස්ථාන අතර මාර්ග ප්‍රවේශතාවය වැඩිදියුණු කිරීමය. මෙහි දිගුකාලීන බලපෑම වන්නේ ජාතික හා පළාත් මාර්ගවල කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම වේ. ණය ගිවිසුම අනුව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 117,780 කට සමාන එ.ජ.ඩො.මිලියන 906 ක් වන අතර ඉන් රු.මිලියන 104,000 කට සමාන එ.ජ.ඩො. මිලියන 800 ක් මූල්‍යනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟවී තිබුණි. ඉතිරි මුදල රු. මිලියන 13,780 ක් ශ්‍රී ලංකා රජය විසින් අරමුදල් මූල්‍යනය කිරීමට අපේක්ෂිතය. වැඩසටහනේ මූල්‍ය සැලසුම බහු අදියර මූල්‍ය පහසුකම යටතේ අදියර 06 කින් සමන්විත අතර ඒ අතුරින්, 2020 දෙසැම්බර් 31 දින වන විට එ.ජ.ඩො. මිලියන 557 ක් වූ වෙනම ණය ගිවිසුම් 04 ක් ණය ප්‍රදානකරු සමඟ විය. වැඩසටහන එහි කටයුතු 2014 ජූනි 01 දින ආරම්භ කරන ලද අතර 2024 සැප්තැම්බර් 30 දින වන විට නිමකිරීමට නියමිතය.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2.1 වගුවේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර වැඩසටහනේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතී වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

වැඩසටහනේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම ඊට සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන,වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී ඒ සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනිව හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑම් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම්කිරීම පිණිස වැඩසටහනේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1** **ගිණුම්කරණ අඩුපාඩු**

| අංකය | ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| ------ | --------------------- | ---------- | ----------------------- | --------------------- |
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 05 හි 36 වන ඡේදයට පටහැනිව, විදේශ මෙහෙයුම්වලින් පැන නගින විනිමය වෙනස්කම් වැඩසටහනේ ශුද්ධ වත්කම් යටතේ හඳුනාගෙන නොතිබුණි. | මිලියන 158.33 | වැඩසටහනේ ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී එය නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. | විදේශ මෙහෙයුම්වලින් පැන නගින විනිමය වෙනස්කම් වැඩසටහනේ ශුද්ධ වත්කම් යටතේ හඳුනාගත යුතුය. |
| (ආ) | කි.මී. 2,231.3 ක දිගකින් යුත් ග්‍රාමීය හා ජාතික මාර්ග 544 ක් 2020 දෙසැම්බර් 31 දින වන විට මාර්ග සංවර්ධන අධිකාරියට භාර දී තිබුණද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 ට අනුකූලව එහි පිරිවැය වත්කම් ලෙස හඳුනාගෙන නොතිබුණි. | නිශ්චය කළ නොහැක. | තනි මාර්ග ඉදිකිරීමේ පිරිවැය නිවැරදිව ලබා දිය හැක්කේ ඉහත පවරා ගැනීමේ ක්‍රියාවලිය අවසන් වූ පසුව පමණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 ට අනුකූලව වත්කම් හඳුනාගත යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ට පටහැනිව, 2020 දෙසැම්බර් 31 දිනට අතුරු ගෙවීම් සහතික 08 ක හිඟහිටි ගෙවීම් සඳහා ප්‍රතිපාදන සපයා නොතිබුණි. | මිලියන 58.95 | 2020 ට අදාළ අතුරු ගෙවීම් සහතික 2021 දී ලැබී ගෙවීම් කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ට අනුකූලව ප්‍රතිපාදන සැලසිය යුතුය. |
| (ඈ) | පැකේජ 07 ක පුනරුත්ථාපන කටයුතු මුළුමනින්ම අවසන් කර තිබුණද, 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල කාර්ය සාධනය මත පදනම් වූ නඩත්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිශ්චය කළ නොහැක. | 2021 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල කාර්ය සාධනය මත පදනම් වූ නඩත්තුව සඳහා ප්‍රතිපාදන සැලසීමට සටහන් කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ට අනුකූලව ප්‍රතිපාදන සැලසිය යුතුය. |

## 2.2 නොසැසඳු ශේෂයන්

| මූල්‍ය ප්‍රකාශන වලට අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| රු. මිලියන 5,806.1 | භාණ්ඩාගාරයට අනුව රු. මිලියන 7,132.43 කි. | මිලියන 1,326.33 | සැසඳුම් ප්‍රකාශ 2021 සිට විගණනයට ඉදිරිපත් කරනු ලැබේ. | අදාළ පාර්ශවයන් සමඟ සාකච්ඡා කර වෙනස්කම් අවම කළ යුතුය. |
| | විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට අනුව රු. මිලියන 6,698.44 | මිලියන 892.34 | | |

## 2.3 රීති සහ රෙගුලාසි ආදියට අනුකූල නොවීම

| අංකය | රීති සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) | කොන්ත්‍රාත්තුවේ විශේෂ කොන්දේසිවල 14.6 උප වගන්තිය | කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ යුතු අවම අතුරු ගෙවීම් සහතිකය පිළිගත් කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 1.5 කි. කෙසේ වෙතත්, අවශ්‍ය අවම සීමාවට වඩා අඩු පැකේජ 20 ක් යටතේ අතුරු ගෙවීම් සහතික ඇගයීමට ලක් කළ අවස්ථා 67 ක් නිරීක්ෂණය විය. | කොවිඩ් -19, අයහපත් කාලගුණය, ද්‍රව්‍ය හිඟවීම වැනි හේතු නිසා කොන්ත්‍රාත්කරුවන්ට අමතර පිරිවැයක් දැරීමට සිදු විය හැකිය. අප නියමාකාරව කොන්දේසි පිළිපදින්නේ නම් කොන්ත්‍රාත්කරුවන්ගේ මුදල් ප්‍රවාහයට බලපානු ඇති අතර ඔවුන්ට අවම ප්‍රගතියවත් අත්කර ගැනීමට නොහැකි වනු ඇත. | පිරිවැය, කාලය සහ කොන්ත්‍රාත්කරුවන්ට අනවශ්‍ය අනුග්‍රහය දැක්වීම අවම කිරීම සඳහා කොන්ත්‍රාත් කොන්දේසිවල දක්වා ඇති සීමාවන් පිළිපැදීම අවශ්‍ය වේ. |
| (ආ) | කොන්ත්‍රාත්තුවේ සාමාන්‍ය කොන්දේසිවල 4.2 උප වගන්තිය | කොන්ත්‍රාත්කරුවන් විසින් කාර්ය සාධන සුරැකුම්පත් ඔවුන්ගේ වියදමින් ලබා දිය යුතු වුවද, කොන්ත්‍රාත්කරුවන්ට හිමිකම්පෑමට හැකි වන පරිදි ප්‍රමාණ පත්‍රවල මූලික හා පොදු අයිතමයන් යටතේ වෙනම ගෙවීම් අයිතමයක් දක්වා ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව, කොන්ත්‍රාත්කරුවන් විසින් | මෙම මුදල ප්‍රමාණ පත්‍රවල වෙනම අයිතමයක් ලෙස සපයා නොමැති නම්, ලංසුකරුට එම පිරිවැය වෙනත් ප්‍රමාණ පත්‍ර අයිතමයන්වල පොදුකාර්ය පිරිවැයට ඇතුළත් කළ හැකිය. කෙසේ වෙතත්, සාමාන්‍ය කොන්දේසි සංශෝධනය කරන ලද අතර, නැගෙනහිර, උතුරු සහ බස්නාහිර පළාත් පැකේජ වල ප්‍රමාණ පත්‍රවල තිබුණු එම ගෙවීම් අයිතමය ඉවත් කරන ලදී. | ලංසු ලියකියවිලි නිකුත් කිරීමට පෙර ප්‍රසම්පාදන විශේෂඥ සහ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රමාණ පත්‍ර සමාලෝචනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ලබාගත් කාර්ය සාධන බැඳුම්කරවල පිරිවැය ප්‍රතිපූරණය කිරීම සඳහා රු. මිලියන 564.45 ක අතිරේක මුදලක් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබුණි. තවද, එම මුදල කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකර ගැනීමට 2020 දෙසැම්බර් 31 දක්වා කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) | කොන්ත්‍රාත් සාමාන්‍ය කොන්දේසිවල 15.3 උප වගන්තිය. | කේයූ 4, කේයූ 5, පීයූ 2, පීයූ 3, ආර් 2 සහ ජී1 කොන්ත්‍රාත් පැකේජ අවසන් කිරීමේදී ඒවායේ වටිනාකම 2020 දෙසැම්බර් 31 දක්වා සකස් කර නොතිබුණි. | පීයූ 2, පීයූ 3, කේයූ 3, කේයූ 4 සහ කේයූ 5 කොන්ත්‍රාත් පැකේජ වලට අදාළව කොන්ත්‍රාත් පැකේජ අවසන් කිරීමේදී ඒවායේ තක්සේරු වටිනාකම සහ සේවා යෝජකයාගේ හිමිකම්පෑම් සකස් කර ඉදිරිපත් කර ඇත. | කොන්ත්‍රාත් අවසන් කිරීමේදී වටිනාකම නිසි වේලාවට සකස් කළ යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය**

| අංකය | සංරචකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| ------ | ---------- | --------------------- | ---------------------------- | ------------ |
| (අ) | ජාතික හා ග්‍රාමීය මාර්ගවල මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු ප්‍රදානය කිරීම | මූලික සැලැස්මට අනුව වැඩසටහනේ කාල සීමාව තුළ ජාතික මාර්ග කි.මී. 218.19 ක් සහ ග්‍රාමීය මාර්ග කි.මී. 3,106.10 ක් පුනරුත්ථාපනය කිරීමට අපේක්ෂා කළද, 2020 දෙසැම්බර් 31 දින වන විට ජාතික මාර්ග වලින් කි.මී 104.13 ක් පමණක් ප්‍රදානය කර තිබුණි. | සෑම වසරකම ලැබෙන අයවැය ප්‍රතිපාදන මත පදනම්ව කොන්ත්‍රාත් ලබා දීමේ ප්‍රමුඛතා පිළිබඳව වැඩසටහනට තීරණය කිරීමට සිදුවිය. ඒ අනුව, ප්‍රමුඛතා වෙනස් වීම හේතුවෙන් මූලික සැලැස්ම වෙනස් කර ජාතික මාර්ග ලබා දීම ප්‍රමාද කිරීමට ව්‍යාපෘතිය තීරණය කරන ලදී. | වැඩසටහනේ මූලික සැලැස්මට අනුකූලවීමට සහ කාල සීමාව තුළ ඉලක්කය සපුරා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ආ) | ජාතික හා ග්‍රාමීය මාර්ගවල පුනරුත්ථාපන කටයුතු අවසන් කිරීම. | ග්‍රාමීය මාර්ග කි.මී 2,203.87 ක ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කර 2020 දෙසැම්බර් 31 දින වන විට මාර්ග සංවර්ධන අධිකාරියට භාර දී තිබුණි. තවද, කොන්ත්‍රාත් පැකේජ 12 කට අදාළ ග්‍රාමීය මාර්ග කි.මී. 1,000.43 ක් 2020 දෙසැම්බර් 31 දින වන විට අත්හැර දමා තිබුණි. | කොන්ත්‍රාත්තු කොන්දේසි වල දක්වා ඇති පරිදි දුර්වල කාර්යසාධනය සහ කොන්ත්‍රාත්කරුවන් විසින් වැඩ අත්හිටුවීම හේතුවෙන් කොන්ත්‍රාත් 12 ක් අවසන් කිරීමට සිදුවිය. | වැඩසටහනේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා සෑම උත්සාහයක්ම ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ජාතික හා ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කිරීම. | අතහැර දමා ඇති කොන්ත්‍රාත් පැකේජ 12 න් 2019 වර්ෂයේදී කොන්ත්‍රාත් පැකේජ 03 ක් අවසන් කර ඇතත්, 2020 දෙසැම්බර් 31 වන විටත් ඉතිරි කටයුතු කරගෙන යාමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | 2020 වර්ෂයේදී අවසන් කරන ලද කොන්ත්‍රාත් පැකේජ 03 ක නැවත ලංසු කැඳවීමට පියවර ගෙන ඇත. | වැඩසටහනේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා සෑම උත්සාහයක්ම ගත යුතුය. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ------- | -------------------- | -------------------------- | ---------------------- |
| (අ) | අතහැර දමා තිබුණු කොන්ත්‍රාත් පැකේජ 12 න්, සමාලෝචිත වර්ෂය තුළදී මෙම ව්‍යාපෘතිය මගින් සිදු කිරීම සඳහා කොන්ත්‍රාත් පැකේජ 05 ක ඉතිරි වැඩ නැවත පිරිනමා තිබුණු අතර නැවත ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත් වල වටිනාකම මුල් කොන්ත්‍රාත් මිලට සාපේක්ෂව රු. මිලියන 5,007 කින් වැඩි කර තිබුණි. | කොන්ත්‍රාත් 12 ක් අවසන් කිරීම සහ නැවත ප්‍රදානය කිරීම මගින් රජයට අමතර වියදමක් දැරීමට සිදුවූ බව පිළිගනිමි. කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් කොන්ත්‍රාත්තු අවසන් කරන ලදී. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව ඉදිකිරීම් අවසන් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළදී කි.මී. 100,000 යේ ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන මගින් අතහැර දැමූ කොන්ත්‍රාත් 04 ක ඉතිරි වැඩ කටයුතු එම අසාර්ථක කොන්ත්‍රාත්කරුගෙන්ම අවසන් කිරීමට ගිවිසුම් අත්සන් කර තිබුණු අතර මුල් කොන්ත්‍රාත් මිල හා සසඳන විට එවැනි කොන්ත්‍රාත් වල වටිනාකම රු. මිලියන 580.14 කින් වැඩිවී තිබුණි. | මිල උච්චාවචනයන් හා ප්‍රසම්පාදන ක්‍රියාවලීන් සඳහා විය හැකි අතිරේක පිරිවැය, කොන්ත්‍රාත් අවසන් කිරීම බලාත්මක කිරීම වැළැක්වීමට කොන්ත්‍රාත්කරු විසින් උසාවි වාරණ නියෝග ලබාගෙන තිබීම, ඉතිරි වැඩ කටයුතු වෙනත් කොන්ත්‍රාත්කරුවෙකුට ප්‍රදානය කිරීම සහ බැඳුම්කර හා ඇපකර මුදල් කර ගැනීම, මහජනතාවට සිදුවන දැඩි අපහසුතාවය අදාල කොන්ත්‍රාත් එම කොන්ත්‍රාත්කරුටම ප්‍රදානය කිරීමේදී සලකා බලන ලදී. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව සහ අමතර පිරිවැයකින් තොරව ඉදිකිරීම් නිම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට පවා අතහැර දමා ඇති කොන්ත්‍රාත් පැකේජ 12 කට අදාළව රු. මිලියන 2,668.47 ක වටිනාකමකින් යුත් කාර්යසාධන බැඳුම්කර මුදල් කර ගැනීමට වැඩසටහන විසින් පියවර ගෙන නොතිබුණි. | ඇපකර සහ බැඳුම්කර මුදල් කර ගැනීම වැළැක්වීම සඳහා කොන්ත්‍රාත්කරුවන් අධිකරණ නියෝග ලබාගෙන ඇති අතර නඩු කටයුතු සිදු වෙමින් පවතී. | හිඟ මුදල් අය කර ගැනීමට වැඩසටහන විසින් වහාම පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | එම නිසා, කොන්ත්‍රාත් අත්හිටුවීම මත මුදල් අයකර ගැනීම හා හිමිකම්පෑම් අවසන් කළ හැක්කේ නඩු කටයුතු අවසන් වූ පසුව පමණි. | |
| (ඈ) | අවසන් කරන ලද කොන්ත්‍රාත් වලට අදාළ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් අයකර ණය දෙන ආයතනයට මුදල් ආපසු ලබා දෙන ලෙස ණය දෙන ආයතනය උපදෙස් දී තිබුණද, අහෝසි කරන ලද කොන්ත්‍රාත් පැකේජ 8 කට අදාළව අයකරගත යුතු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල වූ රු. මිලියන 1,830 ක් අය කර ගැනීමට ව්‍යාපෘතිය අසමත් වී තිබුණි. ඒ අනුව, අතහැර දැමූ පැකේජ 04 ක් ඇතුළුව පැකේජ 12 කට අදාළව 2020 දෙසැම්බර් 31 දින වන විට අයකර නොගත් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුළු එකතුව රු. මිලියන 2,793 ක් විය. | ඇපකර සහ බැඳුම්කර මුදල් කර ගැනීම වැළැක්වීම සඳහා කොන්ත්‍රාත්කරුවන් අධිකරණ නියෝග ලබාගෙන ඇති අතර නඩු කටයුතු සිදු වෙමින් පවතී. එම නිසා, කොන්ත්‍රාත් අත්හිටුවීම මත මුදල් අයකර ගැනීම හා හිමිකම්පෑම් අවසන් කළ හැක්කේ නඩු කටයුතු අවසන් වූ පසුව පමණි. | හිඟ මුදල් අය කර ගැනීමට වැඩසටහන විසින් වහාම පියවර ගත යුතුය. |
| (ඉ) | එම්ජ් 03 සහ එන්ජ් 03 කොන්ත්‍රාත් පැකේජ 2018 දෙසැම්බර් සහ 2020 පෙබරවාරි මාසවලදී අවසන් කර තිබුණද, වැඩ අවසන් කිරීමේ ප්‍රකාශය (SAC) 2020 දෙසැම්බර් 31 දින වන විටත් සම්පූර්ණ කර නොතිබුණි. තවද, කාර්ය සාධනය මත පදනම් වූ නඩත්තු කොන්ත්‍රාත්කරු විසින් විගණනයට අනාවරණය කර නොතිබුණි. | කොන්ත්‍රාත් පැකේජයේ එම්ජ් 03 සහ එන්ජ් 03 හි වැඩ අවසන් කිරීමේ ප්‍රකාශ (SACs) 2021 වර්ෂයේදී සම්පූර්ණ කර ඇත. | වැඩ අවසන් කිරීමේ ප්‍රකාශ ප්‍රමාදයකින් තොරව සකස් කළ යුතුය. |
| (ඊ) | කෙසේ වෙතත්, ජී 1 කොන්ත්‍රාත් පැකේජය 2019 පෙබරවාරි 12 දින අවසන් කළද, නිම කිරීමේ පිරිවැය 2020 දෙසැම්බර් 31 වන විටත් තක්සේරු කර නොතිබුණි. | ජී 1 කොන්ත්‍රාත් පැකේජය නිම කිරීමේ පිරිවැය 2021 දී ඇගයීමට ලක් කර ඇත. | නිම කිරීමේ පිරිවැය ප්‍රමාදයකින් තොරව සකස් කිරීම අවශ්‍ය වේ. |
| (උ) | 2019 වර්ෂයේ වයඹ පළාතේ අතහැර දැමූ කොන්ත්‍රාත් පැකේජ 05 කට අදාළ මාර්ග, ධාවනය කළහැකි තත්ත්වයට පත්කර ගැනීම සඳහා සිදුකළයුතු හදිසි වැඩ කටයුතු අවසන් කිරීමට වෙනත් ක්‍රියාකාරී කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකුට 2020 දෙසැම්බර් 31 දක්වා රු. මිලියන 158.2 ක් වැය කර තිබුණි. | මාර්ග කොටස ධාවනය කළහැකි තත්ත්වයට පත්කර ගැනීම සඳහා ඉක්මණින් කිරීමේ අවශ්‍යතාවය ඇති ඉතිරි වැඩ ඇතුලත් හදිසි ආරක්ෂිත වැඩ සඳහා විචලන නියෝග නිකුත් කරන ලදී. | දැරූ අමතර වියදම් අදාළ කොන්ත්‍රාත්කරුවන්ගෙන් අය කර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

**3.3 වැඩබිම් පරීක්ෂාවේදී සිදුකරන ලද නිරීක්ෂණ**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කළුතර දිස්ත්‍රික්කයේ කේඑල් 2 සහ කේඑල් 3 කොන්ත්‍රාත් පැකේජ සම්පූර්ණ කර ඇත්තේ සියයට 35.15 ක් සහ සියයට 51.83 ක් පමණක් වන අතර ඒවා 2019 වර්ෂයේදී අතහැර දමා තිබුණි. තවද, පාර දෙපස (Shoulders) සහ වෙනත් ව්‍යුහයාත්මක ඉදිකිරීම් සිදුකිරීමෙන් තොරව, පාරේ තැන් කිහිපයක තාර (Asphalt) දමා ඇති අතර එම පැකේජ දෙක සඳහා පිළිවෙලින් රු. මිලියන 772.84 ක් සහ රු. මිලියන 747.47 ක් ගෙවා තිබුණි. | කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය සහ කොන්ත්‍රාත්කරු විසින් වැඩ අත්හිටුවීම හේතුවෙන් එම කොන්ත්‍රාත්තු අවසන් කර තිබුණු අතර මේ වන විට නැවත ලංසු කැඳවීමේ ක්‍රියාවලිය සිදු කරමින් පවතී. තවද, මෙම කොන්ත්‍රාත්තුවේ කොන්ත්‍රාත්කරු උසාවියෙන් වාරණ නියෝගයක් ලබාගෙන ඇත. | එම කාර්යය තවදුරටත් ප්‍රමාදයකින් තොරව අවසන් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | අක්කර 500 සිට දිවෙන සාගර පලන්සූරිය පාරේ (අයිඩී 30) 3+700 ස්ථානයේ පිහිටා තිබුණු බෝක්කුව නව බෝක්කුවක් ඉදිකිරීම සඳහා කඩා දමා තිබුණද, කේඑල් 03 කොන්ත්‍රාත් පැකේජය අතහැර දැමීම හේතුවෙන් එය පරීක්‍ෂණ දිනය වූ 2021 මාර්තු 10 දින වන විටත් ආරම්භ කර නොතිබුණි. මාර්ගය භාවිතා කරන්නන් අපහසුතාවයට පත්ව ඇති අතර මාර්ගය සම්බන්ධ කිරීම සඳහා මාර්ගය පසෙක පිහිටි පෞද්ගලික ඉඩමක් භාවිතා කිරීමෙන් තාවකාලික විසඳුමක් ලබා ගැනීමට සිදුව තිබුණු බව නිරීක්ෂණය විය. | කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය සහ කොන්ත්‍රාත්කරු විසින් වැඩ අත්හිටුවීම හේතුවෙන් එම කොන්ත්‍රාත්තු අවසන් කර තිබුණු අතර මේ වන විට නැවත ලංසු කැඳවීමේ ක්‍රියාවලිය සිදු කරමින් පවතී. තවද, මෙම කොන්ත්‍රාත්තුවේ කොන්ත්‍රාත්කරු උසාවියෙන් වාරණ නියෝගයක් ලබාගෙන ඇත. | එම කාර්යය තවදුරටත් ප්‍රමාදයකින් තොරව අවසන් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | ඒබීසී මිශ්‍රණ තට්ටුව ඇතිරීමෙන් පසු සමහර මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම අතහැර දමා තිබුණු බව නිරීක්ෂණය විය. | කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය සහ කොන්ත්‍රාත්කරු විසින් වැඩ අත්හිටුවීම හේතුවෙන් එම කොන්ත්‍රාත්තු අවසන් කර තිබුණු අතර මේ වන විට නැවත ලංසු කැඳවීමේ ක්‍රියාවලිය සිදු කරමින් පවතී. තවද, මෙම කොන්ත්‍රාත්තුවේ කොන්ත්‍රාත්කරු උසාවියෙන් වාරණ නියෝගයක් ලබාගෙන ඇත. | එම කාර්යය තවදුරටත් ප්‍රමාදයකින් තොරව අවසන් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.4 පරිබාහිර ගෙවීම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළදී ණය මුදලින් භාවිතයට නොගත් අරමුදල් මත ණය දෙන ආයතනයට රු. මිලියන 290.81 ක කැපකරු ගාස්තු අනාර්ථික ලෙස ගෙවා තිබුණු අතර 2020 දෙසැම්බර් 31 දිනට සමුච්චිත කැපකරු ගාස්තු රු. මිලියන 1,471.26 ක් විය. | එය ආර්ථික නොවන ගෙවීමක් වුවද කැපකරු ගාස්තු ගෙවීම නොවැළැක්විය හැකිය. නමුත් අරමුදල් භාවිත ඉලක්ක සපුරා ගැනීමෙන් එය අවම කළ හැකිය. | අනවශ්‍ය පිරිවැය අවම කිරීමට කටයුතු කළ යුතුයි. |